# රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත්
# සභා හා පලාත් පාලන අමාත්‍යංශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් විදේශ මූල්‍යාධාර යටතේ, ඇමරිකානු ඩොලර් මිලියන 250 ට වඩා ඉක්මවූ මුළු වටිනාකමක් ඇති ව්‍යාපෘති සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සහ සැලසුම් එකකයක් පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යංශය ස්ථාපිත කර ඇත.
එමගින් මෙම අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන මාර්ග ව්‍යාපෘති, අපජල කළමණාකරණ ව්‍යාපෘති, පානීය ජල ව්‍යාපෘති, ගොඩනැගිලි/පාලම් ව්‍යාපෘති සහ අධ්‍යාපන පහසුකම් ව්‍යාපෘති වැනි ව්‍යාපෘති මනා කොට සම්බන්ධීකරණය හා පාලනය කරමින් රජයේ ආයෝජන සැලැස්ම යටතේ හඳුනා ගනු ලබන සංවර්ධන ඉලක්ක නියමිත කාලය තුල සාක්ෂාත් කර ගැනීම සඳහා එම අංශයේ පහත පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | තනතුරු සංඛ්‍යාව | මට්ටම | වැටුප් මට්ටම |
|---|---|---|---|
| ඉංජිනේරු උපදේශක (මාර්ග) | 01 | Ps3 | රු.180,000 – 195,000 |
| අභ්‍යන්තර විගණක | 01 | Ps4 | රු.155,000 – 170,000 |

1. <u>අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද</u>

| ඉංජිනේරු උපදේශක | අභ්‍යන්තර විගණක |
|---|---|
| 01.විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවපිළිගත් විශ්ව විද්‍යාලයකින් විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් උපාධියක්<br>සමග<br>උපාධිය සම්පූර්ණ කළ දින සිට අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 14 ක පළපුරුද්දක් තිබීම මෙයින් වසර 7ක් ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්ය වේ. | 01.විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් උපාධියක්<br>හෝ<br>අදාල පිළිගත් වෘත්තිය ආයතනයක අන්තර් මාධ්‍ය විභාගය සමත් වීම.<br>සමග<br>වසර 09 ක අදාල ක්ෂේත්‍රය තුල සුදුසුකම් ලබා ගැනිමෙන් පසු වසර 09 ක සේවා පළපුරුද්ද |

| | |
|---|---|
| 02.විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධියක් **සමග** පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තිය ආයතනයක පූර්ණකාලීන සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 12 ක පළපුරුද්ද<br><br>03.රජයේ දීප ව්‍යාප්ත සේවයන්ගේ පළමු පන්තියේ නිළධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍ර යේ සමාන මට්ටමක තනතුරක් දැරීම සමග වසර 11 ක් පළමු පන්තියේ නිළධාරියෙකු ලෙස පළපුරුද්දක් ලබා තිබීම. | 02.රජයේ දීප ව්‍යාප්ත සේවයන්ගේ දෙවන පන්තියේ හෝ තෙවන පන්තියේ නිළධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍ර යේ සමාන මට්ටමක තනතුරක් දැරීම සමග වසර 11 ක දෙවන පන්තියේ හෝ තෙවන පන්තියේ නිළධාරියෙකු ලෙස පළපුරුද්දක් ලබා තිබීම . |

<u>පොදු කොන්දේසි:</u>

1. වයස අවුරුදු 64 ට අඩු විය යුතුය. (2020.02.16)

2. රාජ්‍ය සේවකඅර්ථසාධක අරමුදල සඳහා දායකත්වය සේවකයාගේ මාසික වැටුපෙන් 8% ක ප්‍රතිශතයක්වන අතර සේව්‍යයාගේ ප්‍රතිශතය 12% ක්ද වෙයි.

3. සේවා කොන්දේසි - මෙම තනතුර මූලික වශයෙන් එක් වසරක් සඳහා වන කොන්ත්‍රාත් පදනම මත වන අතර සතුටුදායක කාර්යසාධනය හා අමාත්‍යාංශයේ අවශ්‍යතාවය මත දීර්ඝ කිරීමේ ඉඩ ප්‍රස්ථාව පවතී.

4. මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

මේ සදහා උනන්දුවක් දක්වන පුද්ගලයින් ඔවුන්ගේ ජීව දත්ත තොරතුරු අදාළ අධ්‍යාපන සහතික සහ පළපුරුද්ද පිළිබද සහතිකවල පිටපත් සමග ලේකම් ,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යශය, අංක 330, යූනියන් පෙදෙස ,කොළඹ 02 ලිපිනයට 2020 මාර්තු 2 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන ලද තනතුර පිළිබදව ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සදහන් කළ යුතුය.

**එස් .හෙට්ටිආරච්චි**
ලේකම්
රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා සහ පලාත් පාලන අමාත්‍යංශය